## අයදුම්පත් කැඳවීමේ නිවේදනය

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා විවෘත බඳවා ගැනීම 2026**

**01.** මෙම දෙපාර්තමේන්තුවේ පවතින උපදේශන නිලධාරි තනතුරේ පුරප්පාඩු 13 ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. තනතුරෙහි කාර්ය භාරය**

බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ආකාරයකට අදාළ වන මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්තාපනය සහ උපදේශනය,සමාජරෝග වැළක්වීම, හා උපදේශනය, ආබාධිත පුනරුත්තාපන,මානසික රෝගීන් සම්බන්ධව පුනරුත්තාපන කටයුතු හා උපදේශනය ,බන්ධනගාර නිලධාරීන්ගේ මානසික තත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීමක් ලබා දීමත්, ඒ සඳහා අවශ්‍ය නිර්දේශ හා වැඩසටහන් පිළිබඳව යෝජනා ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අනුමැතිය මත ඒවා ක්‍රියාත්මක කිරීම සහ බන්ධනාගාර නිලධාරීන්ට අවශ්‍ය උපදේශන කටයුතු හා නිලධාරීන්ගේ සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති කටයුතු වලදී අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම.

**03. තනතුරෙහි ස්වභාවය**

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

**04. මාසික වැටුප් පරිමාණය**

**4.1** රු.53,060 – 10 X 800 – 11 X 1,190 – 10 X 1,320 – 5 X 1,350 – 94,100/- (MN 4 – 2025)
(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන්පරිදි රු. 53,060/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ).

**4.2** I වන කාර්යක්ෂමතා කඩඉම උපදේශන නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර සමත් විය යුතුය.

**4.3** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**05. බඳවාගැනීමේ සුදුසුකම්**

**5.1 අධ්‍යාපන සුදුසුකම්**
රා.සේ.කොා.ස. චක්‍රලේඛ අංක 01/2025 අනුව පිළිගත් උපදේශනය, අපරාධ විද්‍යාව, සමාජ විද්‍යාව, සමාජ මානව විද්‍යාව, මනෝ විද්‍යාව, හෝ ඊට සමගාමී විෂයයන් පිළිබඳ විශේෂ උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

සටහන: තනතුරේ ස්ථිර කිරීමට හෝ උසස්වීම් ප්‍රදානය කිරීමට පෙර ඒ ඒ උපාධියේ සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්ව විද්‍යාලයෙන් සත්‍යාපනය කර ගැනීමට කටයුතු කරනු ලබේ .

**5.2 වෘත්තීය සුදුසුකම්**
ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**5.3 පළපුරුද්ද**
ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**5.4 කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**5.5. සුදුසුකම් පිළිබඳ සීමාවන්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අවසර නොමැත.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
v. උපදේශන නිළධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගන්නා තෙක් අනු අංක 5.4 හා 5.5 (i), (ii) හි දක්වා ඇති සුදුසුකම් බලපැවැත්වේ.

**06. වයස් සීමාව**

**6.1** අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
**6.2** උපරිම සීමාව : අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

**7.1** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| උපදේශනය ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීම | 50 | 25 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 10 | |
| පලපුරුද්ද | 10 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| පරිගණක දැනුම | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

i. උපදේශන නිලධාරි තනතුරට තෝරා ගැනීමට නම් ඉහත වගුවෙහි උපදේශනය ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 50 න් 25 ක් ලබා ගැනීම අනිවාර්ය වේ.
ii. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය**

**8.1** මෙම නිවේදනයට අමුණා ඇති අයදුම් පත්‍රය අනුව ඉල්ලුම්පත සැකසිය යුතුය.

**8.2** නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්‍ර නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හා නියමිත දිනට නොඑවන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදු වන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

**8.3** ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථීර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**8.4** දැනට රජයේ සේවයේ නියතු නිලධාරීන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවැනි නිලධාරියකු තෝරා ගතහොත් දැනට සේවය කරන ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා තහවුරු කර තිබිය යුතුය.

**8.5** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර **"බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා වන විවෘත බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2026.12.15 දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට එවිය යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
ආයතන ශාඛාව,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර,
කොළඹ 09.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙහි සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ උපදේශන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීම
ආදර්ශ අයදුම්පත්‍රය

01. i. සම්පූර්ණ නම :- .....

ii. මුලකුරු සමග නම :- .....

02. ස්ථිර ලිපිනය :- .....

03. ජාතික හැඳුනුම්පත් අංකය :- .....

04. උපන්දිනය :- අවුරුද්ද : ☐ මාසය: ☐ දිනය : ☐

05. 2026.12.15 දිනට වයස :- අවුරුද්ද : ☐ මාසය: ☐ දිනය : ☐

06. ස්ත්‍රී / පුරුෂ භාවය :- ..... 07. විවාහක /අවිවාහක බව :- .....

08. i. දුරකථන අංකය :- ජංගම : ..... ස්ථාවර :.....

ii. විද්‍යුත් තැපැල් ලිපිනය :- .....

09. අධ්‍යාපන සුදුසුකම් :- **(සහතිකපත්‍රවල පිටපතක් බැගින් අමුණන්න).**

| පාඨමාලාවේ නම | විෂයයන් හා සමාර්ථය | ලියාපදිංචි අංකය (ශිෂ්‍ය අංකය) | විශ්ව විද්‍යාලයේ නම | උපාධිය බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|---|
| 01. උපාධිය :-<br>.....<br>.....<br>..... | | | | |
| 02. වෙනත් සුදුසුකම් :-<br>.....<br>.....<br>..... | | | | |

10. වෘත්තීය සුදුසුකම් :- **(සහතිකපත් හෝ ලිපි මඟින් තහවුරු කල යුතුයි)**

| වෘත්තීය සුදුසුකම | කාලය (වර්ෂ ගණන) | ආයතනයේ නම |
|---|---|---|
| 01. | 01. | 01. |
| 02. | 02. | 02. |
| 03. | 03. | 03. |

11. පළපුරුද්ද :- **(සහතිකපත් හෝ ලිපි මඟින් තහවුරු කල යුතුයි)**

| තනතුර | කාලය(වර්ෂ ගණන) | ආයතනයේ නම |
|---|---|---|
| 01. | 01. | 01. |
| 02. | 02. | 02. |
| 03. | 03. | 03. |

(සැ:යු - සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල හා ලිපිලේඛනවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය. අදාළ සහතිකපත් ලිපිලේඛන අමුණා එවනු නොලබන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

12. **අයදුම්කරුගේ සහතිකය :-**

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි යැයි උපදේශන නිළධාරී තනතුර සඳහා බඳවා ගැනීමට පෙර හෝ බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු වන බව හොඳාකාරව දනිමි.

..... .....

දිනය අයදුම්කරුගේ අත්සන

13. **අත්සන සහතික කිරීම** :-

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... **මහතා/මිය/මෙය** මම පුද්ගලිකව හඳුනමි. **ඔහු/ඇය** ..... දින පහත අත්සන මා ඉදිරියේදී තැබූ බව සහතික කරමි.

..... .....

දිනය සහතික කරන තැනැත්තාගේ අත්සන

සහතික කරන අයගේ සම්පූර්ණ නම :- .....

තනතුර :- .....

ලිපිනය :- .....

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

14. **රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.**

..... යන අය මෙම ආයතනයේ ..... කු/ක වශයෙන් සේවය නියුක්ත බවද, **ඔහුගේ/ඇයගේ** වැඩ හා හැසිරීම සතුටුදායක බවද, **ඔහුට/ඇයට** විනය පරීක්ෂණ/විනය විරෝධී ක්‍රියා ඇති/නැති බවද, තනතුර සඳහා තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙහි නිදහස් **කළ හැකි/නොහැකි** බව ද ප්‍රකාශ කරමි.

..... .....

දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන